# 19 සාන්තුවර බැතිය



19.1 රූපය - ශුද්ධ වූ අන්තෝනි මුනිතුමා

1. ශුද්ධ වූ අන්තෝනි මුනිතුමා පිළිබඳ ඔබ දන්නා කරුණු තුනක් ලියන්න.
2. එතුමාගේ ජීවිතයෙන් ඔබගේ ජීවිතයට ගත හැකි වැදගත් ම ආදර්ශය කුමක් ද?

රූප වන්දනාව යනු පුද්ගලයෙක් හෝ රූපයක් හෝ ලෞකික වස්තුවක් හෝ දේවත්වයෙන් සලකා, ඔහුට හෝ ඇයට හෝ එයට හෝ වන්දනා කිරීම යි. ප්‍රතිමා, රූප හෝ පින්තූර මගින් සිදු වනුයේ ඒවා මගින් පිළිඹිබු වන පුද්ගලයා අපගේ මතකයට ගෙන ඒම යි. තව ද මෙම ප්‍රතිමාවලට හෝ රූපවලට හෝ ප්‍රාතිහාර්යය පෑමේ බලය ඇති බව විශ්වාස නොකළ යුතු ය. ප්‍රතිමා, බොරලික්කම් හෝ වෙනත් පලඳනා ආදිය දේව ආශීර්වාදයෙන් ශුද්ධවත් කර ඇත. ඒවා ගෞරවයෙන් පරිහරණය කළ යුතු ය. සාන්තුවරු තම ජීවිත කාලය ම දෙවියන් වහන්සේ වෙනුවෙන් ජීවත් වී, ඔවුන් වහන්සේ වෙනුවන් සාක්ෂි දරමින් මෙලොවින් සමු ගත් අය වූහ. ප්‍රතිමාවකට හෝ රූපයකට හෝ ගරු බුහුමන් දක්වන විට, එයින් පිළිඹිබු වන්නේ එම රූපයේ සිටින පුද්ගලයාට ගරු කරන බවයි. ප්‍රතිමාවල පරමාර්ථය එම පුද්ගලයා සිහිපත් කිරීම යි. දෙවියන් වහන්සේගේ මිත්‍රත්වය දිනා ගත් පුද්ගලයෙකුට ගරු බුහුමන් දැක්වීමෙන් දෙවියන් වහන්සේට වන්දනා කරන බව අදහා ගත යුතු ය. සාන්තුවරුන්ට ගරු කළ යුත්තේ, ඔවුන්ගේ ආදර්ශවත් දිවිය උදෙසා ය. එබැවින්

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ඔවුන්ට යාච්ඤා කරමින්, ඔවුන්ගේ ශුද්ධ වූ ධාතුවලට හා ප්‍රතිමාවලට ගරු බුහුමන් දක්වන්නෙමු. ඔවුන්ගේ ආදර්ශ අනුගමනය කරමින් අපගේ ජීවිත ගොඩනඟා ගත හැකි ය.

"උන්වහන්සේගේ සළුවට පමණක් අත තැබුව හොත්, මට සුවය ලැබෙනු ඇතැ"යි සළුවට අත ගැසූ ස්ත්‍රිය විශ්වාස කළා ය. මෙයින් පෙන්නුම් කෙරෙනුයේ ජේසුස් වහන්සේගේ සළුව ශුද්ධ වූ වස්තුවක් ලෙස ඇය සැලකූ බව යි.

පැරණි ගිවිසුමේ ද ප්‍රතිමා භාවිත කෙරිණි,

- ⋆ කෙරුබ්වරු (දේව දූතයන්) (නික්ම යාම 25:18-22) ⟶ ගිවිසුම් කරඬුව අලංකාර කරන පිණිස සාදන ලද රූපය
- ⋆ ලෝකඩ සර්පයා (ගණන් කථාව 21:8-9) ⟶ සර්පයන් දෂ්ට කළ අයට සුවය ලබන පිණිස සාදන ලදි. මේවා සාදන ලද්දේ දෙවියන් වහන්සෙගේ ම උපදෙස් අනුව ය.

## ශුද්ධවන්තයින්

නුඹ සඳහා නෙළූ රූපයක් හෝ ඉහළ අහසෙහිවත්, පහළ පොළොවෙහිවත්, පොළොවෙන් යට ජලයෙහිවත් ඇති කිසි ම වස්තුවකට සමාන දෙයක් හෝ සාද නොගන්න, නුඹ ඒවාට නමස්කාර නොකරන්න; ඒවාට නොවඳින්න. මන්ද, නුඹේ දෙවි සමිඳාණන් වහන්සේ වන මා **ප්‍රතිවාදීන්** නොඉවසන දෙවි කෙනෙකු වන බැවිනි. මට වෛර කරන පියවරුන්ගේ පාපය නිසා තුන් වන, සතර වන පරම්පරාව දක්වා ඔවුන්ගේ දරුවන්ට මම දඬුවම් කරමි.

(නික්ම යාම 20:5)

දෙවියන් වහන්සේ "ප්‍රතිවාදීන්" නොඉවසන සේක. ප්‍රතිවාදීන් යනු වෙනත් දෙවි දේවතාවන් ය. එම නිසා ශුද්ධවන්තයෝ යනු ප්‍රතිවාදීහු නොවෙති. ශුද්ධවන්තයන් කතෝලික අපට ආදර්ශයකි. ශුද්ධවන්තයින්ට, ශුද්ධ වූ ද්‍රව්‍යයන්ට, ශුද්ධ වූ ස්ථානවලට අගෞරව කිරීම පාපයකි. ඔවුහු දැනටමත් ස්වර්ගීය සැපත හිමිකර ගෙන සිටිති. ශුද්ධවන්තයෝ දේව අභිමුඛයේ සිටින්නෝ ය. ඔවුහු අප වෙනුවෙන් යාච්ඤා කරති.

ශුද්ධවන්තයින්ගේ ආදර්ශය අනුව ඔබට කළ හැකි දෑ

- ජීවිතයේ සෑම කටයුත්තක දී ම දෙවියන් වහන්සේට මුල්තැන ලබා දීම
- දේව වචනයට මුල් තැන දෙමින් දිනපතා ශුද්ධ බයිබලය කියවා මෙනෙහි කිරීම

- සාන්තුවරුන් අන් අයට උදව් වීමට මැදහත් වන ආකාරයට අප ද අන් අයට උදව් වීමට නොපසුබට විය යුතු ය
- සාන්තුවර චරිත කතා කියවමින් ඒවා තම ජීවිතයට ආදර්ශයක් කර ගැනීම
- සාන්තුවරුන් දේව නියමයන් අනුව ජීවත් වූ ආකාරය පිළිබඳ කරුණු සොයා ගෙන ඒ අනුව ජීවත් වීම
- දේවස්ථානයේ සාන්තුවර මංගල්‍ය අවස්ථාවල පැවැත්වෙන නුවාන හා දිව්‍ය පූජාවට සම්පූර්ණයෙන් ම සහභාගි වීම.

**ක්‍රියාකාරකම**

1. සාන්තුවර බැතිය පිළිබඳ කරුණු ඇතුළත් කර දෙබසක් නිර්මාණය කරන්න.
2. ඔබ කැමති සාන්තුවර ජීවිත කතාවක සාරාංශය ලියන්න.
3. එම සාන්තුවර ජීවිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ තුනක් ලියන්න.



**ජීවිතයට බිඳක්**

***සාන්තුවර ජීවිත අනුකරණය කරමු.***